# විශ්‍රාම ගියපසු තැන්පතු මුදලින් කොටසක් ලබා ගැනිම උපදෙස්/ පිරික්සුම්

## ප්‍රතිපත්ති

- නීත්‍යානුකූලව යුද්ධ හමුදා සේවයෙන් විශ්‍රාම/අස්ව ගොස් තිබිය යුතුය විශ්‍රාම දිනයෙන් පසුව අයදුම්පත ඉදිරිපත් කල යුතුය.
- බැඳුනු දිනය,, විශ්‍රාම ගිය දිනය, නිනොනො කාල සීමාව, නිවැරදිව සඳහන් කල යුතුය.
- පෙර සිටි ඒකක හා එම ඒකකයන්හි භාවිතා කල ආධුනික අංක, රෙජී අංක සහ කාල සීමාවන් (වසර 18 සම්පූර්ණ වීමට ප්‍රථම යුද්ධ හමුදාවට බැඳී නැවත බඳවාගත් අයෙකු නම් පෙර සිටි ඒකක හා එම ඒකකයන්හි භාවිතා කල ආධුනික අංක, රෙජී අංක සහ කාල සීමාවන්) සඳහන් කල යුතුය.

## කොන්දේසි හා අවශ්‍ය ලිපිලේඛන

- ජාතික හැඳුනුම්පතෙහි සහතික කල ඡායාස්ථ පිටපත ඉදිරිපත් කල යුතුය.
- බැංකු පොතේ සහතික කල පැහැදිලි ඡායාස්ථ පිටපත (සක්‍රිය ගිණුමක) ඉදිරිපත් කල යුතුය.
- අයදුම්පතෙහි හා ලියකියවිලිවල සඳහන් නමෙහි (මුලකුරු සහිත නම සහ සම්පූර්ණ නම) පරස්පරතාවයක් ඇත්නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කල යුතුය සියළු පිටපත් සහතික කල පැහැදිලි පිටපත් විය යුතුය.
- අයදුම්පත අණදෙන නිලධාරි හා මධ්‍යස්ථාන සේනාවිධායක විසින් අත්සන් කර නිල මුද්‍රාව තැබිය යුතුය.
- විශ්‍රාම ගොස් පළමුවරට තැන්පතු මුදලින් කොටසක් ලබා ගැනිමේදි කර්නල් හා ඉන් ඉහල නිළයේ ජ්‍යෙෂ්ඨ නිළධාරින්ගේ අයදුම්පත් මධ්‍යස්ථාන සේනාවිධායක විසින් පමණක් අත්සන්කර ඉදිරිපත්කල යුතු අතර, ලුතිතන් කර්නල් නිළය සහ ඉන් පහල සියලුම අයවළුන්ගේ අයදුම්පත් අණදෙන නිළධාරිගේ සහතිකයෙන් හා මධ්‍යස්ථාන සේනාවාධායකගේ නිර්දේශයෙන් ඉදිරිපත්කල යුතුය. (දෙවනවර සිට අයදුම්කරු විසින් අයදුම්පත සම්පූර්ණකර ඉදුරාම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරිම ප්‍රමාණවත් වේ.)

## ප්‍රතික්ෂේප විමට හේතු

- විශ්‍රාම ගිය දිනය සදහන් නොකිරිම
- අයදුම්පතෙහි සදහන් විස්තර නිවැරදිව සම්පූර්ණ නොකිරිම
- පුද්ගලික අනන්‍යතාවය පරීක්ෂා කිරිමේදි ජාතික හැඳුණුම්පත හා ගිණුම් විස්තර අනුව නොගැලපීම් සිදුවන අවස්ථාවලදි එහි නිවැරදිතාවය පරීක්ෂා කිරිම සදහා දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් නොකිරිම
- දැනට යාවත්කාලින කර ඇති නව අයදුම්පත් වෙනුවට පැරණි අයදුම්පත් ඉදිරිපත්කර තිබීම
- දැනට අයදුම්කරුගේ යාවත්කාලිනව පවතින ගිණුම් අංකය වෙනුවට පැරණි ගිණුම් අංක අයදුම්පතට ඇතුලත්කර තිබීම
- අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර ඒකක අණි සහතික කර නොමැති අවස්ථාවකදි
- අයදුම්පත් සමග ඉදිරිපත්කල යුතු අනිකුත් ලියකියවිලි ඒකක අණි සහතික කර නොමැති අවස්ථාවලදි
- අයදුම්පත සමග ඉදිරිපත් කලයුතු අනිකුත් ලියකියවිලි අමුණා නොමැති අවස්ථාවන්හිදි
- අයදුම්පත ඉදිරිපත් කරන සාමාජිකයාගේ අත්සන පරස්පර වන අවස්ථාවලදි